# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2250/25 - 2021 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

64(1) වැනි වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 64(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, රත්තොට ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන, ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී මණ්ඩලයට, රත්තොට ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63 (1) වැනි වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධිවිධාන මෙම නියමය මගින් උපලේඛනයේ ඇතුළත් කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 05 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
''ලක්දිය මැදුර'',
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

#### උපලේඛනය

**61(1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ:**

(අ) පහත දැක්වෙන සියලුම චංචල හා නිශ්චල දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය වෙත සතු කළ යුතුය. එනම්,

(i) රත්තොට ප්‍රාදේශීය සභාව යටතේ, ඇති පුංචි රත්තොට ජල සම්පාදන ක්‍රමයට අයත් ජල මූලාශ්‍ර, සේවා ජලාශ, ජල


1A - G 35152 - 20 (2021/10)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පවිත්‍රාගාර, පීඩන ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම ඉඩම්, ගොඩනැගිලි, ජලනල, සියලුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවි කිරීම් ද, ඒ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය.

(ii) රත්තොට ප්‍රාදේශීය සභාව යටතේ ඇති බඹරකිරිඇල්ල ජල සම්පාදන ක්‍රමයට අයත් ජල මූලාශ්‍ර, උපලේඛනයේ I හි දැක්වෙන ස්ථානයේ පිහිටි සියලුම සේවා ජලාශ, ජල පවිත්‍රාගාර, පීඩන ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම ඉඩම්, ගොඩනැගිලි, ජලනල, සියලුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවි කිරීම් ද, ඒ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය.

(ආ) රුපියල් 13,037,626/- (රුපියල් එක් කෝටි තිස් ලක්ෂ තිස් හත් දහස් හයසිය විසි හය) ක් වටිනා මේ පහසුකම්වල වත්කම්, ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

**උපලේඛනය 1**

| *අනු අංකය* | *ප්‍රමාණය* | *මිනින්දෝරු සැලසුම් අංකය* |
|---|---|---|
| 01 | හෙක්ටයාර් 0.0453 | සර්වේයර් ජෙනරාල්ගේ මා 659 අංක දරන මූලික පිඹුරේ කැබලි අංක 01 |

11-26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.